# අයවැය කථාව
# 2012

නැගෙනහිර පළාත් සභාව
ත්‍රිකුණාමලය.

ගරු සභාපතිතුමණි,

නැගෙනහිර පළාත් සභාවේ 2012 වර්ෂය සඳහා වන අයවැය වාර්තා අද දින සභාගත කිරීම ගැන සතුටට පත්වෙමි.

නැගෙනහිර පළාත් සභාව උද්යෝගිමත්ව ක්‍රියාත්මකවීමට පටන්ගත් දා සිට ජාතික ප්‍රතිපත්තීන් සමග එකට බැඳි ක්ෂේත්‍ර ක්‍රමෝපායන් හා නව අරමුණු ඉලක්ක කරගත් සංවර්ධන ව්‍යාපෘතීන් සමග අපගේ පළාත නිර්මාණාත්මක සංවර්ධන වෙමින් පවතී. ස්ථිරසාර මාර්ගෝපදේශනයන් සමඟ මෙම පළාත ඉදිරි වර්ෂවල ප්‍රාදේශීය සංවර්ධනයත් එක්ව ඉහළ ආර්ථික සංවර්ධන ලඟාකරවීමට අවශ්‍ය සවිමත් අඩිතාලම දමා තිබෙන බව ඉතා සාඩම්බරයෙන් ගරු සභාවට දන්වා සිටිමි.

### *ප්‍රගති ගමන*

මෙවැනි පසුබිමක ලංකාවේ දළ දේශිය නිෂ්පාදනයෙහිලා නැගෙනහිර පළාතේ දායකත්වය සැළකිය යුතු අන්දමින් වැඩිවී ගොස් 2010 වර්ෂයේ සියට 5.9 ප්‍රතිශත දක්වාවූ වර්ධන කරා ඉහළ ගොස් තිබුණි. මෙමගින් පළාත් මට්ටමින් 7වැනි ස්ථානයක තිබූ අප පළාත 06 වැනි ස්ථානයට පත්වීම, තවද 2007 වර්ෂයේ බිලියන 185,000 ක් තිබූ අප පළාතේ දළ ජාතික නිෂ්පාදනය 2010 වර්ෂයේ බිලියන 332,000 දක්වා ඉහළ නංවා තිබුණු අතර, මෙය අප පළාතේ වාර්ෂික තනි පුද්ගල ආදායම රුපියල් 212,000 දක්වා වර්ධනය වීමට ඉඩසැළැස්වී තිබුණු බව විශේෂයෙන් දැකිවිය හැකිය.

මෙම ප්‍රතිඵල සතුකර ගැනීමට ගරු ආණ්ඩුකාර, පළාත් සභා නිළධාරීන්, දිස්ත්‍රික්ක හා ප්‍රාදේශීය මට්ටමේ ආයතනයන් අප සමග අත්වැල් බැඳගෙන ක්‍රියාත්මක වූ අතර, ඔවුන්ගේ උපදේශන හා සහයෝගය ලබාදී තිබුණි. ඉදිරි වර්ෂවලත් අපගේ ජයග්‍රාහී ගමනට ඔවුන්ගේ සහයෝගය එලෙසින්ම ලැබේ යැයි අපේක්ෂා කරමු.

### *නැගෙනහිර පළාත් සංවර්ධන සැළැස්ම*

“මහින්ද චින්තන - අනාගත දූරදැක්ම” යන සංවර්ධන ප්‍රතිපත්ති රාමුවේ සඳහන් වී තිබෙන බහුවිධ සමතුළිත ප්‍රාදේශීය සංවර්ධනයත් සමග අප පළාතටම ආවේණික විශේෂිත අවශ්‍යතා සම්පත්, හා හැකියාවන් අන්තර්ග්‍රහණය කරමින ගත් නැගෙනහිර පළාතේ සංවර්ධන ක්‍රියාවලියන් නව උද්වේගයකින් ඉදිරියට අඛණ්ඩව ගෙන යාමට නියමිත වී ඇත. මෙමගින් මානව සාරධර්මයන් මෙන් යහපාලනය හා ජීවන මට්ටම යනාදියෙහි ඉතාමත් සස්රික ප්‍රදේශයක් බවට නැගෙනහිර පළාත බිහිවේ. යන දූරදැක්ම පදනම් කරගනිමින් සකස් කරන ලද “නැගෙනහිර පළාත් සංවර්ධන සැලැස්ම” යන 5 වසරක සැළැස්ම යන කෘතිය ඔබ ඉදිරියේ ප්‍රකාශයට පත්කිරීම ගැන සතුටු වෙමි.

මෙම සැළැස්මෙහි ප්‍රධානතම සංවර්ධන ක්ෂේත්‍ර 06 ක් යටතේ රුපියල් මිලියන 378,000 වටිනා ආයෝජන අවශ්‍යතාවයන් හඳුනා ගෙන තිබෙන අතර, ඒ සඳහා අවශ්‍ය වන මුල්‍ය සැපයුම් මධ්‍යම රජයෙන් හා ආධාර සපයන ආයතන හා ස්වේච්ඡා සංවිධාන මගින් ලබාගැනීමට සැලසුම් කර තිබේ.

ඉදිරි පස් වර්ෂය තුළ නැගෙනහිර පළාතේ එක් එක් ක්ෂේත්‍රයක් සඳහාම ඉලක්කයන් තීරණය කරගෙන එය ළගාකර ගැනීමට අවශ්‍ය ක්‍රමෝපායන් පෙළගස්වනු ලැබූ වැඩ සටහන්වල සාරාංශයන් ද මෙයට ඇතුළත් කරගෙන තිබේ. මෙම ඉලක්කයන් සාර්ථක කරගැනීමට හැකිවන අයුරින් එළඹෙන සෙසු වර්ෂවල අප පළාතේ සංවර්ධන ක්‍රියාවලියන් ඒකාබද්ධ කිරීමට නියමිතව ඇත.

නැගෙනහිර පළාතේ සියළු ජනතාවන්ට අවශ්‍ය ප්‍රතිලාභ සනාථකරන අයුරින් සකස් කොට ඇති මෙම සැලැස්මට අවශ්‍ය ආයෝජන සොයාගැනීම හා එය නිසි අයුරින ක්‍රියාත්මක කරවීමේ ක්‍රියාවලියන්හි මෙම පළාත් සභා සමග එකට එක්ව කටයුතු කිරීමට අපි අධිශ්ඨාන කරගන්නා අතර, මෙයට සම්බන්ධවන සියළු සංවර්ධන කොටස්කරුවන් ගේ සහයද අයැද සිටිමි.

***පළාත් සභා මුල්‍ය ප්‍රතිපාදන***

2012 වර්ෂය සඳහා මුදල් කොමිෂන් සභාව විසින් නැගෙනහිර පළාත් සභාවට පුනරාවර්තන වියදම් සඳහා රුපියල් මිලියන 11,385 ක් ද, ප්‍රාග්ධන වියදම් සඳහා රුපියල් මිලියන 1,192ක් ද, දේශීය හා විදේශ මුල්‍යාධාරවලින් යුක්ත විශේෂ ව්‍යාපෘති වැඩසටහන් සඳහා රුපියල් මිලියන 4,455 ක මුදල් ද වෙන්කර තිබේ.

පුනාවර්තන වියදම් ප්‍රතිපාදනයට අමතරව රාජ්‍ය ආදායම් එකතු කිරීම් වලින් මධ්‍යම ආණ්ඩුවෙන් එකතුකර ගත් ආදායමෙන් රුපියල් මිලියන 1,600 ද පළාත් සභා ආදායම් වලින් රුපියල් මිලියන 636 ක් ද ලැබේ යැයි අපේක්ෂා කෙරේ. මේ අයුරින් රුපියල් මිලියන 13,621 ක මුදල් පළාත් සභාවේ පුනාවර්තන වියදම් සඳහා ඊළග වර්ෂයේ ප්‍රයෝජනයට ගැනීමට නියමිතය. මෙම මුදලින් 80% ක මුදල් පළාත් රාජ්‍ය නිලධාරින්ගේ වැටුප් ගෙවීම් සඳහා වෙන් කර තිබේ.

මුළු ප්‍රාග්ධන වියදමින් රුපියල් මිලියන 74 ක් ගරු පළාත් සභා මන්ත්‍රීවරුන්ගේ සංවර්ධන ක්‍රියාවලියන් සඳහා ඍජු ලෙස වෙන්කරවා ඇත. තවත් රුපියල් මිලියන 193 ක් පළාත් ආයතන සංවර්ධනය හා සේවා සැපයුම් වැඩි දියුණු කිරීමටත් වෙන්කර තිබේ. මේ සමග ක්ෂේත්‍ර සංවර්ධන සඳහා විශේෂ වැඩසටහන් වල අමතරව ක්ෂේත්‍ර සංවර්ධනය සඳහා මිලියන 925 යටිතල පහසුකම් සංවර්ධනය හා නිෂ්පාදන අංශයේ කුඩා පරිමාණ ව්‍යාපෘතින් සඳහා ප්‍රමුඛතා පදනම මත බෙදාහැර තිබේ.

නැගෙනහිර පළාත් සභාවේ සංවර්ධන සඳහාවන මුදල් උපයෝගිතාවය ජාතික දිස්ත්‍රික්ක හා පළාත් පාලන මට්ටමින් ආයතනයන් සමඟ සම්බන්ධකම් පවත්වා ගනිමින් අවශ්‍යවූ විට රාජ්‍ය හා පෞද්ගලික අංශයන්ද සම්බන්ධ කරගනිමින් ඵලදායි ව්‍යාපෘතින් ක්‍රියාත්මක කිරීමට අප අවධානය යොමු කරමු.

තවද ඉදිරිපත් කරනු ලබන මුල්‍ය ප්‍රතිපාදන වෙන්කිරීම නිසා පළාත් මහජනතාවගේ දියුණුව උදෙසා ඵලදායි ප්‍රතිඵල ළඟාකර ගැනීමට අපි සැළකිලිමත්ව තහවුරු කරමු. මෙමගින් විශේෂයෙන් ජනතාවන් සෞඛ්‍ය සම්පන්නව ජීවත් කරවීම, ඔවුන්ගේ දැනුම හා විශේෂිත කුසලතාවයන් වර්ධනය කිරීම, නිෂ්පාදන හා රැකියා අවස්ථාවන් මගින් ආදායම් මාර්ග පුළුල් කිරීම, පොදු පහසුකම් ලබාදීම, ජීවන තත්ත්වයන් ඉහළනංවාලීම පදනම් කරගනු ලැබේ.

***සමානාත්මක ප්‍රාදේශීය සංවර්ධන අරමුණු කරගත් මධ්‍ය කාලීන සැළැස්ම***

“ආර්ථික සංවර්ධන ක්‍රියාවලියේ දී පවුල් සියල්ල එක හා සමාන ප්‍රතිලාභ භුක්ති විඳීම සනාථ කළ යුතු යැයි” යන ප්‍රතිපත්තිය අනුව අප පළාතෙහි ද සමාන සංවර්ධනය අරමුණු කරගෙන පසුබෑමකට ප්‍රදේශවල සංවර්ධන උදෙසා ආයෝජනය කිරීමේ වැඩපිළිවෙල අනුගමනය කරමින් සිටිමු. මෙම ක්‍රමය යටතේ නිෂ්පාදන අංශයන් වැඩිදියුණු කරදීම තුළින් රැකියා අවස්ථාවන් උදාකර නොදියුණු පළාත් වැසියන්ගේ ආදායම් වැඩිකිරීමට ඉඩසළස්වා දීම මගින් ඔවුන්ගේ ජීවන මට්ටමද ඉහළ නංවාළීමට මග සෑදෙනු ඇත. දිළිඳු ජනවැසියන්ගේ කුසලතාවයන් හා භෞතික සම්පත් ස්ථිරසාර සංවර්ධනය සඳහා යොදවීමට ඉඩසැළැස්වීම මෙම සැළැස්මේ විශේෂිත ගුණාංගයකි.

මෙවැනි පියවර ඔස්සේ 2012 වර්ෂයේ දිස්ත්‍රික්කයන් 3 හිදීම ජීවත්වන සියළු වාර්ගික ජනකොටස් ඇතුළත් කරගනිමින් සුදුසු ක්‍රමවේදයන් මගින් නොදියුණු ගම් 09 ක් තෝරාගනු ලැබ සම්පූර්ණයෙන් රුපියල් මිල්ලියන 120 ක වටිනා සුළු පරිමාණ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරවීමට අපේක්ෂා කෙරේ.

***නිෂ්පාදන අංශ***

නැගෙනහිර පළාත් කෘෂිකර්ම අංශයයෙහිලා 29% දායකත්වය ලබාදෙමින් සිටියි.

මේ රටේ මුළු වී නිෂ්පාදනයෙන් 24% දායකත්වය අප පළාත සතුකරගෙන තිබෙන අතර 2006 වර්ෂයේ 0.7 මෙට්‍රික්ටොන් වශයෙන් තිබූ වී නිෂ්පාදන 2009 වර්ෂයේ 1.14 මෙට්‍රික් ටොන් ලෙස ඉහළ නැංවීම අප පළාල ලැබූ ජයග්‍රහණයකි. එනමුත් මෙම වර්ෂ ආරම්භයේ සිදුවූ ජලගැලීම් හේතුවෙන් ඇතිවූ මහ විනාශයෙන් නැගෙනහිර පළාතේ වී වගාව විශාල ලෙස හානියට ලක්වීම, අවාසනාවන්ත සිද්ධියක් වේ. කෙසේ වෙතත් සෙසු ආහාර බෝග වගා කටයුතු

වලදී මෙම පළාත පසුගිය කාලවකවානුව තුළ ඉහළ මට්ටමින් යුක්ත නිෂ්පාදන ඉලක්කයන් ලගාකර තිබීම ගැන මා වෙත සතුටට පත්වෙමි.

රටේ සත්ත්ව නිෂ්පාදන සම්පත්වලින් 30% අප පළාත සතුවේ. සම්පූර්ණ කිරි නිෂ්පාදනයේ 17% දායකත්වය ලබාදෙනු ලැබේ. 2006 වර්ෂයේ වාර්ෂිකව ලිටර් 140,000 ලෙස පැවති කිරි නිෂ්පාදන 2010 වර්ෂය වනවිට ලිටර් 177,000 වශයෙන් වැඩි වී තිබීම විශේෂිත කරුණක් වේ. මෙම කාලවකවානුව තුළ පශු සම්පත් සංවර්ධනය කිරීමේ අරමුණු කරගෙන පශු වෛද්‍ය කාර්යාල 21ක්ද, කිරි කල්තබාගැනීමේ මධ්‍යස්ථාන 07ක් සහ කිරි එකතු කිරීමේ මධ්‍යස්ථාන 14ක් හා සත්ව රෝග පර්යේෂණ මධ්‍යස්ථාන 02 ක්ද මෙම පළාත් සභාවේ ස්ථාපිත කර තිබේ.

ගතවූ වසර 3ක් තුළ මිරිදිය මත්සයන් නිෂ්පාදන වර්ධනය ව සශ්‍රික ඉලක්කය ළගාකරමින් පවතියි. මිරිදිය අංශය නැගෙනහිර පළාත තුළ තවදුරටත් වර්ධනය කිරීමේ අරමුණින් අළුතින් මත්ස්‍ය සංවර්ධන අංශය කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ පිහිටුවන ලදුව එමගින් සේවාව දිස්ත්‍රික්ක 3ටම ව්‍යාප්ත කර තිබේ.

මෑතක සිට කර්මාන්ත ක්ෂේත්‍රය නැගෙනහිර පළාතේ ප්‍රධානතම ක්ෂේත්‍රයක් බවට වර්ධනය වෙමින් පවති. රෙදි කර්මාන්ත, කොහු කර්මාන්ත, අනෙකුත් අත්කම් භාණ්ඩ නිෂ්පාදන යන ක්ෂේත්‍රවල අලෙවි කිරීම් පහසුකම් වැඩිදියුණු කර දී ඇති අතර, ඉහළ නිෂ්පාදන තාක්ෂණයන් ද හඳුන්වා දී තිබේ.

නිෂ්පාදන අංශ සංවර්ධනය ගත්විට නැගෙනහිර පළාත් සභාව නිෂ්පාදනවල වර්ධන ස්ථිරසාර ආහාර රක්ෂණය, එක්කල වටිනාකම, ස්වයංරැකියා දිරිගැන්වීම්, නිෂ්පාදන හැකියාවන්, වර්ධනය වූ ආදායම්, යනාදි කරුණු කෙරෙහි විශේෂිත අවධානය යොමු කර තිබේ. මේ සඳහා ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන, කෘෂිකර්ම සංවර්ධන, ග්‍රාම සංවර්ධන හා සංචාරක ව්‍යාපාර හා කර්මාන්ත යන කෙරෙහි 2012 වර්ෂයේ වැඩි අවධානය යොමු කර තිබේ.

ස්වභාවික පොහොර භාවිතය, ගුණාත්මක නිෂ්පාදන අස්වැන්නෙන් පසු මතුවන හානින් අවමකිරීම යනාදි කරුණු සඳහා ද සුදුසු උපදේශන හා පියවර අපේ ක්‍රියාත්මක සැළසුම්වළට ඇතුළත් කරනු ලැබේ. භෝගවන්වලට අවශ්‍ය වාරිමාර්ග පහසුකම් ප්‍රමාණවත් ලෙස ලැබීම ගැන වාරිමාර්ග අංශය හරහා තහවුරු කරගැනීමේ අවශ්‍යතා අපහට ඇතිවී තිබේ යැයි අවධාරනයෙන් ප්‍රකාශ කර සිටිමි.

ග්‍රාමීය කර්මාන්තයන් පහසුවෙන් මෙහෙයැවීමටත්, විශේෂ කර්මාන්තයන් පහසුවෙන් මෙහෙයැවීමටත්, විශේෂ කර්මාන්තනේ ගැන දැනුවත් කර අවශ්‍ය

පුහුණු ලබාදීමට අදාල සුදුසු ව්‍යාපෘතින් ඉදිරි වර්ෂවල ක්‍රියාත්මක කිරීමට අප පළාත් සභාව අපේක්ෂා කෙරේ.

මෙවන් අවස්ථාවක තෘතියික අධ්‍යාපන හා වෘතිමය අධ්‍යාපන කොමිෂන් සභාව නැගෙනහිර පළාත සමග එක්ව නැගෙනහිර පළාත සඳහා වෘතිමය අධ්‍යාපන පුහුණු වැඩසටහන් එකක්ව (VET Plan) සකස් කරගෙන තිබෙන බව මෙම අවස්ථාවක ප්‍රකාශයට පත්කිරීම සුදුසු යැය සිතමි.

මෙම ව්‍යාපෘතිය යටතේ නැගෙනහිර පළාතේ පිහිටි එක් එක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලීය මට්ටමින් අවම ලෙසින් වෘතිමය මධ්‍යස්ථාන එකක් හෝ පිහිටුවා ගැනීමට සුදුසු පියවර ගෙන ඇත. පාසැල් හැර ගිය අයටත්, රැකියා විරහිත තරුණ තරුණියන් සඳහාත් සුදුසු වෘතිමය හා කුසලතා වර්ධන ලබාදෙමින් කර්මාන්ත වෙළඳ පොළට සුදානම් කර නව රැකියා අවස්ථාවන් ද ඇති කර දෙමින් රැකියා විරහිතයන්ගේ ප්‍රතිශතය 5% දක්වා අවම කිරීමට බලාපොරොත්තු වේ.

සංචාරක ව්‍යාපෘති සංවර්ධන වැඩසටහනට සුදුසු සම්පත් වලින් පිරී ඇති අපගේ පළාතෙහි මෙම ක්ෂෙත්‍රයේ ජාතික ප්‍රතිපත්තිය හා සමග සුදුසු යයි හඳුනාගත් ප්‍රදේශ වලින් සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යාපෘති වැඩසටහන් පළාත් මුදලින් හා රාජ්‍ය හා පෞද්ගලික අංශවල සහයෝගය ඇතිව ක්‍රියාත්මක කරගෙන යනු ලැබේ. තවද සංචාරක ව්‍යාපෘති සංවර්ධනයට අවශ්‍ය වෘත්තීය සුදුසුකම් වලින් සමන්විත මානව සම්පත් වර්ධනය කිරීමේ පියවරයන්ද දියත් කරමින් පවතියි. ඉදිරි වර්ෂ වල මේ ක්ෂෙත්‍රය කෙරෙහි වැඩි අවධානය යොමු කරවනු ලබන අතර රැකියා අවස්ථාවන් බිහි කිරීමද අපගේ අරමුණ වේ.

***ආර්ථික යටිතල පහසුකම්***

මහාපරිමාණ ආර්ථික යටිතල ව්‍යාපෘති වැඩසටහන් මධ්‍යම ආණ්ඩුව මගින් අප පළාත් සභාවද ඇතුළත් කොට දීප ව්‍යාප්ත අන්දමින් සංවර්ධන වැඩසටහන් දියත් කරනු ලැබේ. ජාතික ප්‍රතිපත්තියකට අනුකූලවත් නැගෙනහිර පළාතේ ක්‍රියාත්මක වෙමින් පවතින ජාතික ව්‍යාපෘති වැඩසටහන් සමග එකට බැඳී යන ආකාරයෙන් පළාත් සභාව විවිධ යටිතල ව්‍යාපෘති වැඩසටහන් සම්පාදනය කර ක්‍රියාත්මක කරමින් සිටී.

2009 වර්ධය සිට රුපියල් මිලියන 218 ක මුදල් ප්‍රතිපාදන මගින් කිලෝමීටර් 172 වාගේ මාර්ග අළුත් වැඩියා කර තිබේ. ඊට අමතරව විදෙස් ආධාර යටතේ කිලෝමීටර් 315 ක ග්‍රාමීය මාර්ගය හා කිලෝමීටර් 202 ක පළාත් මාර්ග ද පුනුරුත්ථාපන කොට ඇත.

මෙම කාලවකවානුව තුළ නිවාස ඉදිකිරීම් සඳහා මිලියන 44 මුදල් වෙන් කරමින් නිවස් 203 ක් ඉදිකිරීම් කටයුතු නිමා කරමින් ප්‍රතිලාභීන් හට භාරදී ඇත. ඒ සමගම දිස්ත්‍රික්ක 3 හිදිම පානිය ළිං 443 ක් ඉදිකරදිම මගින් ග්‍රාමිය පෙදෙස්වල පානිය ජල අවශ්‍යතා සැළකිය යුතු අන්දමින් ඉටුකර දි තිබේ.

ග්‍රාමිය විදුලි පහසුකම් වෙනුවෙන් රුපියල් මිලියන 21.8 ක වියදමින් සුළු පරිමාණ ව්‍යාපෘති වැඩ සටහන් 76 ක් ද නිමකර තිබේ.

***සමාජ යටිතල පහසුකම් හා සේවාවන්***

නැගෙනහිර පළාත් සභාවේ පදවි ප්‍රාප්තියෙන් අනතුරුව විවිධ අධ්‍යාපන සංවර්ධන කටයුතු දියත් කරනු ලැබීමේ ප්‍රතිඵලයක් වශයෙන් ග්‍රාමීය පාසැල් වල පවතින ගුරු සම්පත් හිඟය සපුරා දි තිබුණ ද පළාතේ පොදු විභාගවල ප්‍රතිඵලයන් වල දියුණුවක් දක්නට ලැබීම ගැන මා සතුටු වෙමි.

ගතවූ තෙවසරක කාලසීමාව තුල අළුතින් කලාප අධ්‍යාපන කාර්යාලයන් 04ක් ආරම්භ කර ඇති අතර කොට්ඨාෂ අධ්‍යාපන කාර්යාල 02 ක් ද ආරම්ළ කර තිබේ. ඒ වාගේම මෙම කාලය තුළ අළුතින් පාසල් 39 ක්ද ආරම්ළ කර තිබේ. තවද මෙතෙක් අක්‍රියව පැවත් පාසැල් 45 ක් නැවත ක්‍රියාත්මක කර තිබේ. පැසල් 135 ක ශ්‍රේණීන් උසස් කර තිබේ.

අධ්‍යාපන ප්‍රතිඵල ගෙන බලනවිට පස්වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ක විභාගයෙන් ලකුණු 100 කට ඉහළින් ලබාගත් ශිෂයන්ගේ ප්‍රතිශතය ක්‍රමයෙන් 18, 35, 41 යන ආකාරයෙන් අඛණ්ඩව වර්ධනය වෙමින් පැවැත්වීම සැළකිය යුතු කරුණකි. එළෙසින්ම අප පළාතේ අ:පො:ස උ:පෙළ ශ්‍රේණියට සුදුසුකම් ලබන ශිෂ්‍යයන්ගේ ප්‍රතිශතය විවිධ අභියෝගයන් මධ්‍යයේ 2008 වසරේ 40.6% සිට 2011 වසරේ 54.7% දක්වා සංවර්ධනය වි තිබේ.

ජාතික මට්ටමින් සසදන විට මඩකලපු මධ්‍ය, කල්මුණේ, අක්කරෙයිපත්තුව, ත්‍රිකුණාමලය, තිරුක්කෝවිල් යන කලාපවල අධ්‍යාපන සංවර්ධනය මෑතකාලින ජාතික මට්ටමට වඩා ඉහළ මට්ටමක පැවතිම ගැන මෙම අවස්ථාවේ පෙන්වා දීමට කැමැත්තෙමි. පොදුවේ අප පළාතෙ තත්වය ජාතික මට්ටම සමග සසදන විට අඩු ස්ථාවරයක් පෙන්වයි. එනමුත් අප පළාතේ අධ්‍යාපනය ක්‍රමක් ක්‍රමයෙන් වර්ධනය වෙමින් පවතින නිසා ඉදිරි අනාගතයේ ජාතික මට්ටමේ තත්වයන් අපි ළගාකරගත හැකි යැයි විශ්වාස කරමි. තවද අප විශ්ව විද්‍යාල ප්‍රවේශයට සුදුසුකම් ලද අයගේ ප්‍රතිශතය 60% ඉහළින් දක්නට ලැබීම ඉතාම හොඳ ප්‍රතිඵලයක් ලෙස මා අදහස් කරමි.

අප පළාතේ සෞඛ්‍ය මානව සුභ සාධන දර්ශකයන් ජාතික මට්ටම සමග සැසඳිය හැකි තරමට උසස් මට්ටමක පවති. සෞඛ්‍ය ක්ෂේත්‍රයේ 2008 වසරේ සිට අද

දක්වා යටිතල පහසුකම් ඉහළ නැංවීමට බාහිර රෝගීන් සඳහා ගොඩනැගිලි 03 ක් ද ශල්‍ය කර්ම, ප්‍රසුතිකාගාර, වෛද්‍ය නිල නිවාස සඳහා ගොඩනැගිලි 26 ක් ද සෞඛ්‍ය නිළධාරින් සඳහා නිල නිවාස 29 ක් ද සෞඛ්‍ය වෛද්‍ය අධිකාරි කාර්යාලයන් 10 ක් ද අළුතින් ඉදිකර ගනු ලැබ හොඳින් ක්‍රියාත්මක වෙමින් පවතී. තවද සෞඛ්‍ය සේවයේ ඉහළ නැංවීමට මහා පරිමාණ යටිතල පහසුකම් කෙරිගෙන යනු ලැබේ.

මෙම කාලසීමාව තුළ ගිලන් රථ 35 ක් ද ක්ෂේත්‍ර අවශ්‍යතාවයන් සඳා වාහන 48 ක් ද කාර්යාලිය අවශ්‍යතාවයන් සඳහා වාහන 32 ක් ද ලබාදෙමින් පළාත් සෞඛ්‍ය හා වෛද්‍ය සේවාවන් ඉහළ නංවා ඇති බව සතුටින් ප්‍රකාශ කරමි. තව ද ආරෝග්‍ය ශාලා 52 ක දැඩි සත්කාර ඒකකයන් හා වෛද්‍ය උපකරණ ද තවත් ආරෝග්‍යශාලා 27 කට පර්යේෂණාගාර උපකරණ කට්ටල සමග තවත් 80% ක සායනවලට ඉතාමත්ම අවශ්‍ය වෛද්‍ය උපකරණ ද ලබදිම මගින් අප පළාතේ වෛද්‍ය සේවාවන් උසස් තත්වයකට පත්කර දියුණු කොට ඇත.

ගතවූ වර්ෂ 03 කදී අළුතින් ඉදිකරන ලද ආරෝග්‍යශාලා 06 ක් සමග තවත් ආරෝග්‍ය ශාලා 08 ක පුනුරුත්ථාපන කටයුතු නිමකර ඇති අතර, 100 කට අදික වෛද්‍ය නිලධාරින් ඇතුළු පත්වීම් 700 ක් ලබාදී තිබේ. මෙම කාලසීමාව තුළ ආරේගයශාලා 04 ක් මූලික රෝහල් බවට උස් ශ්‍රේණිගත කර තිබේ.

දේශිය වෛද්‍ය ක්‍ෂත්‍රයේ පංචකර්ම රෝහල් 03 ක් ද මධ්‍යම ආයුර්වේ ද බෙහෙත් ශාලාවන් 27 ක් ද ඉදිකරදී ඇති අතර, දේශීය බෙහෙත් නිෂ්පාදන අංශයන් ද බිහිකරමින් ඊට අවශ්‍ය කාර්ය මණ්ඩල පහසුකම් ද ලබාදීම මගින් එය සාර්ථකව ක්‍රියාත්මක වෙමින් පවතින බව මා මෙහිදී සතුටින් ප්‍රකාශ කර සිටිමි.

දළ වශයෙන් නැගෙනහිර පළාතේ සෞඛ්‍ය ක්‍ෂත්‍රයෙන් හා වෛද්‍ය සේවාවල සිදු වී ඇති දියුණුව මහජන සෞඛ්‍ය තත්වයෙන් සැළකිය යුතු ප්‍රගතියක් පෙන්වා දෙන අතර, වෛද්‍ය චිකිත්සාව සඳහා බාහිර දිස්ත්‍රික්කවලට යාමේ තත්වයන් ක්‍රමයෙන් වෙනස් වී අප ප්‍රාදේශිය රෝහල් වලින් එය ලබාගැනීමේ ප්‍රවනාතවයන් වැඩි වී තිබේ.

සමාජ යටිතල පහසුකම් දක්නට ලැබෙන මෙවැනි පසුබිමක් සමග නැගෙනහිර පළාත් සභාව තව දුරටත් ශිෂ්‍ය පරපුරේ අධ්‍යාපනය ඉහළ මට්ටමකට ගෙන යාමටත් සෞඛ්‍ය සම්පන්න ප්‍රජාවන් බිහි කිරීමටත් අනාතයන් පෝෂණය කිරීමටත් වැඩිහිටියන් සඳහා සමාජ රැකවරණය ලබාදෙමින් දිළිඳු ජනයන්ගේ සුභ සාධන කටයුතු සඳහා ද සුදුසු ව්‍යාපෘතින් සම්පාදනය කොට 2012 වසරේ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගැනීමට නියමිතව ඇත.

කඩිනම් සමාජ ආර්ථික සංවර්ධනයට අවශ්‍ය කුසලතා හා තාක්ෂණ දැනුම විධිමත් අධ්‍යාපන හරහා බිහිකිරීම යන ප්‍රතිපත්තියට අනුකූලව භාෂාව හා තොරතුරු තාක්ෂණ අධ්‍යාපනය, ශිෂ්‍යයන් කර්මාන්ත වෙළඳ පොළට පෙර සුදානම් කිරීම, ගුරුවරුන්ගේ හැකියාවන් හා කුසලතා වර්ධනය කිරීම යන කරුණු කෙරෙහි ද අවධානය යොමු කරනු ලැබේ. එසේම රෝගයකින් තොරවූ සමාජය බිහිකිරීමේ අරමුණින් දේශීය හා බටහිර වෛද්‍ය අංශයන් මගින් ඒකාබද්ධ සේවයන් ලබාදීම, ලෙඩ රෝගවලින් ජනතාවට රැකවරණය ලබාදෙමින් ඔවුන්ගේ සෞඛ්‍ය තත්වයන් ආරක්ෂා කිරීම, ක්‍රීඩා හා අනෙකුත් කායික අභ්‍යාසයන් කෙරෙහි ද දැඩි අවධානය යොමු කරනු ලැබේ.

***විශේෂ ව්‍යාපෘතීන්***

පළාත් සභා මුදල් ආයෝජනයට පරිබාහිරව මධ්‍යම රාජ්‍ය ආයතනයන් මගින් දියත්කරනු ලබන වැඩසටහන් ගැනත් සෙසු පළාත් සභා ආයතනයන් මගින් ක්‍රියාත්මක කරනු ලබන විදේශ ආධාරවලින් යුක්ත විශේෂ ව්‍යාපෘති වැඩසටහන් ගැනත් මෙහි දී මේ ප්‍රකාශ කිරීම සුදුසු යැයි විශ්වාස කරමි.

විවිධ නව ව්‍යාපෘති වැඩසටහන් අප පළාතේ පවත්නාවූ සමකාලීන දේශපාලනය හා ප්‍රජාතාන්ත්‍රික වාතාවරණය තුළ බිහිවූවක්ය. මෙවැනි වැඩසටහන් අතරින් මහාමාර්ග හා පාලම් ඇතුළු වැව් පුනුරුත්ථාපන වැඩසටහන් රාශියකින් සමන්විත වාරිමාර්ග ව්‍යාපෘතීන්, ජල සැපයුම් වැනි මහා පරිමාණ ව්‍යාපෘතීන් පළාත් ග්‍රාමීය පාරවල් සංවර්ධනය, ග්‍රාමීය ජල සැපයුම්, පළාත් පාලන සේවා සැපයීම් හා අනෙකුත් යටිතල පහසුකම්වලට අමතරව පළාතේ පළාත් පාලන ආයතන සවිමත් කිරීමේ තාක්ෂණ සහයන් ගැනද මෙහි දී සඳහන් කරන්නට කැමැත්තෙමි.

මෙවැනි ව්‍යාපෘතීන් වලින් නෙලාගත් ප්‍රතිලාභ නැගෙනහිර පළාත් ජනතාව දැනට භුක්ති විඳිමින් සිටිතියි යන කරුණු ඉමහත් සතුටක් ගෙනත් දෙන කරුණකි. එසේම වත්මන් වසරෙහි මුලාරම්භයේ සිදුවූ ජලගැලීම් නිසා ඇති වූ හානීන් නිසා විනාශයට පත්වූ මාර්ග හා වැව් සහ වාරිමාර්ග පද්ධතීන් පුනුරුත්ථාපනය කිරීම මගින් මහජනතාවගේ ආර්ථිකය ප්‍රතිසංස්කරණය කිරීම අරමුණු කොටගෙන සැළසුම් කරන ලද ව්‍යාපෘති වැඩසටහන් නොබෝ දිනකින් ආරම්භ කිරීමට නියමිතව තිබේ යැයි සඳහන් කරන්නේ සතුටෙනි

***යහ පාලනය***

ඉහත ව්‍යාපෘති වැඩසටහන් වලට අමතරව නැගෙනහිර පළාත් සභාව මගින් දියත් කරනු ලබන හා යෝජනා කරනු ලබන වැඩසටහන්වලට පණකැවීමට හැකිවන අයුරින් විවිධ නීති කෙටුම්පත් සම්පාදනය කටයුතු සිදුකරගෙන යනු ලැබේ. සෙසු පළාත්වල සම්පාදනය කරනු ලැබූ නීති කෙටුම්පත් අප පළාතටත් ගැලපෙන අයුරින් පරිවර්තනය කිරීමේ ක්‍රියාවලියන් ද සිදුවෙමින් පවතී.

පළාත් සම්පත් පදනම් කරගත් ප්‍රාදේශිය සංවර්ධන හා ජන අවශ්‍යතාවයන් සපුරා ලිමට අවශ්‍ය සේවාවන් යනාදි කරුණු මුදුන්පත් කර ගනිමින් පළාත් මා පළාත් පාලන පරිපාලන ව්‍යුහවල ප්‍රතිසංස්කරණය සිදුකර එම සේවය තවත් කාර්යක්ෂම හා උද්වේගිමත් සේවාවන් බවට පත්කිරිමට අදහස් කර ඇත.

බහුවාර්ගික ජන කොටස් සමගියෙන් ජිවත්වන ප්‍රදේශය අපගේ නැගෙනහිර පළාතය. ජාතින් අතර සමගිය වර්ධනය කිරිමේ ආකාරයෙන් පළාත් සභා ප්‍රතිපත්තින් හා ක්‍රියාකාරකම් පවති. මෙම කරුණු පාලනය මෙන් සංවර්ධනය කියාවලින්වල සියළු අවස්ථාවලදිත් සැළකිල්ලට ගනු ලබන අතර, මෙම ප්‍රතිපත්තිය සමාජ ආමුලික මට්ටම දක්වා රැගෙන යාමට අප කවුරුත් අත්වැල් බැඳගනිමින් කටයුතු කිරිමට ඔබ සියළු දෙනාම ඇරයුම් කරමු.

ගරු සභාපතිතුමණි,

නැගෙනහිර පළාත් සභාව සඳහා 2012 වර්ෂය වෙනුවෙන් වෙන් කරවා ඇති මුලධාරයෙන් පුනාවර්තන හා ප්‍රාග්ධන වියදම් දැරිමේ අරමුණු කර ගෙන මෙම අයවැය යෝජනා නැගෙනහිර පළාත් ජනතාවගේ දියුණුව ගැනත්, සුභ සාධන ගැනත්, දැඩි අවධානය යොමු කරමින් ඵලදායි පදනමින් සම්පාදනය කර තිබෙන මෙම යෝජනා සාර්ථක අන්දමින් සම්මත කිරිමට ඒකමතිකව හා සහයෝගය දක්වන මෙන් ගරු මන්ත්‍රින් සියළු දෙනාගෙන් ඉල්ලා සිටින අතර මෙතෙක් මාගේ දේශනයට ඉවසිමෙන් ඇහුම්කන් දිම වෙනුවෙන් මාගේ ස්තුතිය පුදකරමින් නිමා කරමි.

ආයුබෝවන්.